

# අහංකාර රතු රෝස මල

රැහංසා පින්සරණි ගුණරත්න

# අහංකාර රතු රෝස මල

රුහංසා පින්සරණි ගුණරත්න

# අහංකාර රතු රෝස මල

කතා ප්‍රකාශනයකි

රුහංසා පින්සරණි ගුණරත්න
2 වසර A
මහාමායා බාලිකා විද්‍යාලය

ISBN - 978-624-208-246-2

# පිදුම

නොදත් ශිල්පය
දුන්න මැනවින්
නොසඟවා බිඳුවක්....
අපිත් නොදුටුව
අපේ ලෝකය
දුටුවේ ඔබේ දෑසින්....
මහාමායා මෑණීයනි
ඔබේ පායුග
වඳිමි බැතියෙන්....

# පෙරවදන


සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵළයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එක ගමක ලස්සන උයනක් තිබුණා. ඒ උයනේ මල් ගස් පලතුරු ගස් ලස්සන ලස්සන විවිධ ගස් වැල් වලින් පිරී තිබුණා.




මේ උයනේ ලොකු ගහක් තිබුණා. ඒ ගහ තමා උයනේ පැරණිම ගහ. මේ ගහට හැමෝම කියන්නේ රුක් මාමා. හැබැයි ඒ ගහේ හැදෙන්නේ කජු.



මේ උයනට විවිධ වර්ගයේ සමනල්ලු පාට පාට කුරුල්ලෝ ආහාර සොයාගෙන ආවා. කජු ගහ නිසා සත්තු බඩ පුරවා ගත්තා.

මේ උයනේ ඉන්න ගස් වැල් හොඳ යාළුවෝ. ඒ යාළුවෝ තමයි රෝස ගස, සූරියකාන්ත ගස, පතොක් ගහ, කජු ගහ.


මේ යාළුවෝ අතරින් රෝස මල හරි අහන්කාරයි. සූරියකාන්ත මල හරිම හොඳයි. පතොක් ගහ හරි කරුණාවන්තයි. කජු ගහ හැමෝම එක්ක සතුටින් ජීවත් වුණා.





එක උදෑසනක යාළුවෝ හතර දෙනා හම්බ වුණා. සුභ උදෑසනක් රැක් මාමේ. සුබ උදෑසනක් පතොක් පැංචා ,සුභ උදෑසනක් සූරිකාන්ත ගස, සුභ උදෑසනක් රෝස ගස.

කාලයක් ගෙවුනා. රෝස ගස මෙහෙම කිවුවා. රැක් මාමේ මට දැන් මේ උයන එපා වෙලා තියෙන්නේ . අර පතොක් පැංචාව මට පෙන්නන්න බෑ . එයාගේ තියෙන කටු මට අප්පිරියයි.



රැක් මාමා මෙහෙම කිවුවා. මම නම් මේ උයනට ආදරෙයි. මම ඉපදුනු දවසේ ඉඳලා තමයි මේ උයනේ ඉන්නේ.

සූරියකාන්ත ගස මට නම් දැන් එපාවෙලා තියෙන්නේ. ඊටත් වඩා මට අර පතොක් පැංචාව එපාවෙලා තියෙන්නේ. පේන්න බෑ එයාගේ තියෙන කටු ගොඩ.

අනේ රෝස ගස ඔයා පතොක් පැංචාට නම් බනින්න එපා. එයා හරි අහින්සකයි.




ඔයා මලක් වුණාට වැඩක් නෑ. සමනල්ලු එනවැයි. අනේ රෝස ගස මන් ලඟටත් ඉඳලා හිටලා සමනල්ලු එනවා. පතොක් පැංචො ඔයා මේ උයනෙන් යන්න ඕනේ. ඔයා මේ උයනේ හිටියාම මේ උයන කැතයි බලන්නකො මම ආපු ගමන් මේ උයන ලස්සන වෙන හැටි.



"අනේ රෝස ගස මේ උයන හැර මට වෙන යන්න තැනක් නෑ. ඔයා ඇයි මගෙත් එක්ක තරහා. මම ඔයාට කවදාවත් වැරැද්දක් කරලා නෑනේ."

කාලයක් ගෙවුණා. වැස්ස කාලය නිමා වුණා. ටික ටික අව්ව සැර වැඩි වුණා. ගස් වැල් වලට මෙම අව්ව සැර දරාගන්න අමාරුයි. රැක් මාමාට එයාගෙ ගහේ කොළ අතු නිසා පුංචි සහනයක් ලැබුණා.



සූර්යකාන්ත ගසත් එයාගෙ ලොකු පෙති නිසා ඉර මාමා ගෙන් බේරෙනවා. රෝස ගසට නම් අව්ව සැර දරාගන්න අමාරුයි. එයාගෙ පෙති තුනී නිසා. රෝස ගස හිටියෙ හරි අමාරුවෙන්. ඔය අතරේ රෝස ගස බලාගෙන පතොක් පැංචා ළඟට කුරුල්ලෝ හරියට එනවා.




“රැක් මාමේ රැක් මාමේ ඇයි
පතොක් පුංචා ගාවට ඔය තරම්
කුරුල්ලෝ එන්නේ” රෝස ගස
ඇහුවා.



"එයාගෙ ඇඟ අස්සේ එකතු කරලා තියෙන වතුර තමා බොන්නේ." සූරියකාන්ත ගස රෝස ගසට කතා කළා.

"ඔයාටත් ඕන්නම් පතොක් පුංචාගෙන් ඉල්ල ගන්න."



"පතොක් යාළුවේ මට උදව්වක් කරනවා ද. අනිවාර්යයෙන් ඔයාගේ ඇඟ අස්සේ තියෙන වතුර වලින් මටත් වතුර ටිකක් දෙන්න පුළුවන් ද?."

"හා අපි බට්ටිත්තෙක් ගෙන් උදවු ගමු. මගේ බට්ටි යාළුවේ මගේ ඇඟෙන් වතුර බිංදු අරන් අපේ රෝස ගසට දානවද."
එහෙමයි පතොක් පුංචෝ.

ඊට පස්සේ පතොක් පුංචා ගෙන් වතුර අරන් රෝස ගසට දැම්මා.

"ස්තුතියි පතොක් පැංචා ස්තුතියි
බට්ටි යාළුවේ."
එදා රෝස ගසට තේරුණා
හැමෝ ළඟම හොඳ දේවල්
තියෙනවා කියලා. අනේ
සමාවෙන්න රැක් මාමේ
සමාවෙන්න සූර්යකාන්ත ගස
සමාවෙන්න පතොක් පුංචා ආයෙ
වතුර ඕන්නම් කියන්න. දැන් අපි
හොඳ යාළුවෝනේ. රතු රෝස
ගසට තේරුණා එයා කරපු
වැරැද්ද. පතොක් පුංචා ළඟ
තියෙන වටිනාකම් එයා ළඟ නෑ
කියලා තේරුණා. අද ඉඳලා
ඔයා අපේ හොඳම යාළුවා.
රෝස මලී කිවුවා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්